# විවිධ දැන්වීම්

## අලව්ව ප්‍රාදේශීය සභාව

### 2025 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම

අලව්ව ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්යය කර්තව්‍ය ඉටු කරන අලව්ව ප්‍රාදේශීය සභාවේ ලේකම් එම්. පී. සී. රේණුකා වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 134 (3) වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2025 වර්ෂයට අදාළව අක්කර බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2024.06.05 දින තීරණ අංක 3324 යටතේ මම තීරණය කරමි. එනම් :

2025 වර්ෂය සඳහා පනවන ලද ඒ අක්කර බද්ද, මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන සෑම කාර්තුවක් තුළදී සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

2025 වර්ෂය සඳහා වන සම්පූර්ණ අක්කර බද්ද 2025 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ අක්කර බදු ප්‍රමාණයෙන් සියයට දහය (10%) ක වට්ටමක්ද, එක් එක් කාර්තුවකට අදළ අක්කර බද්ද ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහ (5%) ක වට්ටමක් ද ගෙවනු ලැබේ.

එම්. පී. සී. රේණුකා,<br>ලේකම්,<br>අලව්ව ප්‍රාදේශීය සභාව.

2024 ජූලි මස 01 වැනි දින,<br>අලව්ව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් අලව්ව ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2024 වර්ෂයේ දී බලාත්මක කරන ලද සත්‍යොක්ෂණය කිරීම 2025 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

එකී පනතේ 134 වන වගන්තියේ (3) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූ ද ඉහත කී පනතේ 135 වන වගන්තියේ නියමය යටතේ අක්කර බද්දෙන් නිදහස් කර නොමැත්තාවූ ද, ස්ථිර හෝ නිතිපතා ගොවිතැනක් යටතේ වූ,

(අ) හෙක්ටයාර් පහක් හෝ ඊට වැඩි වූ සෑම ඉඩමක් වෙනුවෙන් ම, එකී ඉඩමේ සෑම හෙක්ටයාරයක්ම මත 2025 වර්ෂය සඳහා රුපියල් දහය (රු.10) බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමටත්,

(ආ) ඉහත කී පනතේ 134 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියේ අතුරු විධානය යටතේ පළාත් පාලන විෂයභාර ගරු අමාත්‍යතුමා විසින් අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය විශේෂ ප්‍රදේශයක් වශයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ IV(ආ) වැනි කොටසේ 1989.03.10 දිනැති *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කර ඇති හෙයින්, හෙක්ටයාර් එකකට වැඩි එහෙත් හෙක්ටයාර් පහකට අඩු වූ සෑම ඉඩමක් මත 2025 වර්ෂය සඳහා රුපියල් පනහ (රු. 50) බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අයකිරීමට, සහ

(ඇ) ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (6) වැනි උපවගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලට පෙර සමාන වාරික හතරකින් ගෙවීමට විධාන කළ යුතු යයි ද අලව්ව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

08 - 21/1